
ඔක්ස්ෆර්ඩ් හා කේම්බ්‍රිජ් පළපුරුදු ශාස්ත්‍රීය හා සමාජීය පරිසරය ප්‍රතිනිර්මාණය කිරීමට අසමත් අසාර්ථක පිරිසක් පේරාදෙණිය බිහි කළ නිසයි. මේ නිසා ඉතා ශීඝ්‍රයෙන් පේරාදණිය පත් වුයේ ප්‍රධාන වශයෙන් රැකියා වෙළෙඳපොළට උපාධිධාරීන් බිහි කරන කම්හලක් බවටයි. එකල සරසවියට ඇතුල් වූ අප සැම එසේ කළ අතර අප ගේ මව්පියන් සිතුයේ උපාධිය වූ කලි රැකියාවට බලපත්‍රයක් බවයි. මෙසේ පැවසීම සත්‍යයක් ලෙස මම සිතමි. එය කිසි විටෙක වරදක් නොවේ. වර්තමානයේ නැඟෙන ප්‍රශ්න නම් විශ්වවිද්‍යාලයක සමාජගත චරිතය සාමාන්‍යකරණය කළ යුත්තේ රැකියා සඳහා උපාධිධරයන් නිපදවීමේ ධාරිතාව මතු නැතහොත් සමාජයට මුල් ඇදුණු මහා උදාරත්වයක් වඩා පෘථුලභාවයක් හා දූරදර්ශී භූමිකාවක අන්තර් ක්‍රියාකාරීත්වය මත විය යුතු ද යන්න මේ දේශනය තුළ මේවා මා විසින් මතු කරන ලද ප්‍රශ්න කිහිපයක් වන අතර, ඉතා සංක්ෂිප්තයෙන් පිළිතුරු දීමට ප්‍රයත්න දැරීමි.

ඔබ ගේ විශ්වවිද්‍යාලයේ සමාජීය විද්‍යා හා භාෂා පීඨයේ විෂය අත්පොතෙහි මම මේ වැකිය කියවීමි. එනම් '21 වන සියවසෙහි අභියෝග භාර ගන්නා නම්‍යශීලී ආත්ම විශ්වාසී හා නවීන පන්නයේ විශ්වවිද්‍යාලයීය උපාධිධරයෙකු තැනීමට අපි මහත් පරිශ්‍රමයක් දරමු' යන්නයි. කුලපතිතුමනි. නූතන යුගයේ විශ්වවිද්‍යාලය අධ්‍යාපනයේ අභිමතාර්ථ මෙතරම් සංක්ෂිප්ත, පැහැදිලි, ශෝභමාන ලෙසත් දරන්නා වූ සරසවියක සම්මාන ආචාර්යෝපාධියක් ලැබීම මහත් අභිමානයක් ලෙස හැඟීමි. සබරගමුව සරසවියේත් එහි ගුරු සිසු හා කාර්ය මණ්ඩලයේත් අභිවෘද්ධිය අඛණ්ඩ ලෙස සෞභාග්‍යයට පත් වෙයි. ■



# කලාව හා බුදුදහම

නතේ කාමා යානි චිත්‍රානි ලෝකේ  
සංක්‍ය පරාගො පුරිසස්ස කාමො  
තිට්ඨානි චිත්‍රානි තථෙව ලෝකේ  
අථෙත්ථ ධීරා විනයාති ඡන්දං

'ලොවේ පවතින්නා වූ විචිත්‍ර වස්තුන් කිසිවිටෙකත් කාමුක වස්තුන් නොවෙයි. නුවණැත්තෝ විසින් එහි ඇල්ම දුරු කෙරෙති. විචිත්‍ර වස්තුන් එලෙසම ලොව පවතියි.'

(බුදුරදුන්-සංයුක්ත නිකාය)

පසුගිය සියවස් විසිපහ මුළුල්ලේම බුදුදහම කලාවේ පෝෂණය සඳහා වූ දායකත්වය බුදු දහම ව්‍යාප්ත වූ සියලුම බෞද්ධ රටවල කලාවට අවධානය යොමු කිරීමෙන් ප්‍රත්‍යක්ෂ වේ. ශ්‍රී ලංකාව ජපානය, චීනය, තායිලන්තය, මියන්මාරය හා කොරියාව යන රටවල ඇති කලාව මෙයට හොඳම නිදසුන් ය. මෙලොව ඇති සියලුම විෂයන් බිහි වී ඇත්තේ මානුෂීය අවශ්‍යතා පදනම් කරගෙන ය. කලාව ද එසේ ය. කලාව සෞන්දර්යයේ මාධ්‍යය මිස කිසිදු කලාවක් සෞන්දර්යම නො වේ. තව ද බුදු දහම ප්‍රචලිත වූ කවර රටක වුව ද කලාවේ ප්‍රතීයමාන වූයේ බුදු දහමයි.

බුදු දහම හා සබැඳි කලාව නිරාමිස සුවයක් නිරාමිස කලා සෞන්දර්යයක් විඳීම සඳහා ඇති මාර්ගයයි. වර්තමානයේ අප දකින කලාව හා බෞද්ධ කලාව බොහෝ සෙයින් අසමාන ය. වර්තමාන සමාජය කලාත්මක නො වන දේ කලාත්මක යැයි පැවසීමට තරම් කලාව පිළිබඳ නො දන්නවුන් රුචිකත්වයක් දක්වයි. නමුත් අප මෙහි දී විමසා බැලිය යුත්තේ බුදු රදුන් හා මහරහතන් වහන්සේ ලා භුක්ති විඳි කලාව කුමක්දැයි යන්න විමසා බැලීමයි.

බුදු රදුන් විසින් 'ගීතය ආර්ය විනයේ හැඬීමක් බඳු ය'. (රුණ්ණ මිදං භික්ඛවේ අරියස්ස විනයේ ගීතං) 'නැටීම ආර්ය විනයේ හි උමතු ක්‍රියාවක් බඳු ය.' (උම්මත්තක මිදං භික්ඛවේ අරියස්ස විනයේ යදිදං නච්චං)

අප කලා රසය භුක්ති විඳින්නේ පංච ඉන්ද්‍රියන් ගේ ද්වි ඉන්ද්‍රිය උපයෝගීතාවෙනි. එනම් ඇස හා කණ මගිනි. බුදුරදුන් ඇතුළු මහා රහතන් වහන්සේලා ද මේ ඉන්ද්‍රිය උපයෝගීතාවෙන් කලා රසය නිරාමිසව භුක්ති විඳි අයුරු ත්‍රිපිටකය මගින් ප්‍රත්‍යක්ෂ වේ. දීඝ නිකාය සක්කපඤ්හ සූත්‍රයේ සඳහන් පරිදි දෙව්ලොව සංගීත ගාන්ධර්ව පංචසිඛ දෙව්පුත් පැමිණ තමා හැර ගිය සූර්ය වච්චසා පිළිබඳ සොවින් බුදුරදුන් අභියස ගීතයක් ගායනා කළේ ය. ඉන් පසුව බුදුරදුන් එය වර්ණනා කරමින් දේශනා කරන්නේ,

'සංසංදතිබෝ තේ පංචසිඛ තන්තිස්සරෝ ගීතස්සරෙන ගීතස්සරො තන්තිස්සරේන'
(ගීතය, වාද්‍ය ස්වරය නො ඉක්ම වූ බවත්, වාදනය ගීත ස්වරය නො ඉක්ම වූ බවත් ය.)

තව ද වරක් බුදු රදුන් සෝන කණ්ණ හිමියන් අලුයම වනතුරු මිහිරි ස්වරයෙන් ගායනා කළ අට්ඨක වග්ගයේ ගාථාවන් අගය කළ සේක. (උදාන පාලි පිටුව 71) මජ්ජිම නිකායේ දී ධම්මචේතිය සූත්‍රයේ දී කොසොල් මහා රජතුමන් බුදුරදුන් වෙත පැමිණ වරක් ප්‍රකාශ කරන්නේ කෘෂ, රළු, දුර්වර්ණ, පඬු පැහැති ඉල්පුණු නහර ඇති මහණ බමුණන් දකින විට සිතෙහි ප්‍රසාදයක් ඇති නොවන බවයි. තව ද බෞද්ධයා ගේ අත්පොත සේ සැලකෙන ධම්මපදය තුළ ද නිරාමිස සුව දෙන කලා රසිකත්වය පිළිබඳ බුදුන් වහන්සේ ගේ අදහස් ප්‍රකාශිත ය.



'රමණීයාණි අරඤ්ඤාණි-යත්ථච රමතී ජනෝ
වීතරාගා රමෙස්සන්ති-න තේ කාම ගවේසිනෝ'
රමණීය වූ වන අරණයන්හි කාම ගවේෂණය කරන්නවුන් ගේ සිත් නො අලවන බවත්, වීතරාගී කාම ගවේෂණය නො කරන උතුමන් ගේ සිත් අලවති.

ආරාමික අපිස් දිවි පෙවෙතෙහි පැවැත්ම ප්‍රබෝධකයක් ලෙස සෞන්දර්යය සලකනු ලැබූ අයුරු විනය පිටකය මගින් ද පැහැදිලි වේ. වරක් බරණැස් සිටුවරයා බුදුරදුන් ආරාම පිළිගන්නවාදැයි විමසූ විට 'බුදුරදුන් පැවසූයේ රම්‍ය විහාරයක් කරවා බහුශ්‍රැත භික්ෂූන් වාසය කරවන' ලෙස ය. තව ද බෞද්ධ චීවරයේ හැඩය මගධයේ වෙල්යායේ ඇති ආකෘතියට නිර්මාණය කර ගන්නා ලෙස උපදෙස් දීමෙන් ද බුදු රදුන් ස්වභාව සෞන්දර්ය හා කලාව බුදුදහමට එක් කළ අයුරු පැහැදිලි වේ.

ඡබ්බග්ගිය භික්ෂූන් ආරාමික ජීවිතයේ සීමාව ඉක්මවා ගොස් තමන් ගේ කුටිවල නිරුවත් කාන්තා රූප මැටි-යන් අඹා බිත්ති සැරසිලි ලෙස භාවිතා කරන විට බුදුරදුන් පැවසූයේ නිරුවත් කාන්තා ඡායාරූප වෙනුවට මල්කම් ලියකම්වලින් තම කුටිය සරසා ගන්නා ලෙසයි. (විනය පිටකය-287 සිට)

ඇස රූපය පිළිබඳ සංයෝජකයක් නො වේ. රූපය ඇස පිළිබඳ සංයෝජකයක් නො වේ. ඒ දෙක පිළිබඳ ව ඇතිවන්නා වූ ඡන්ද රාගමය සංයෝජන වේ. බුදුබව ලබා වසර තම උපන් බිමට නො වැඩිය බුදුරදුන් තම උපන් බිමට වැඩම කරවීමට තීරණය කළේ ඡන්න හිමියන් විසින් ප්‍රකාශ කරන ලද මාර්ග වර්ණනාත්මක ගාථා (ඡන්න ථෙර ගාථා-ථෙර ගාථා) අසා මව් භූමිය කරා වැඩම කරන්නට තීරණය කළේ ය. මෙහිදී ද ස්වභාවය සෞන්දර්යාත්මක බව කලාත්මක ලෙස වර්ණනා කිරීම බුදුරදුන් අගය කොට ඇත.

සමහර විද්වතුන් සේම යම් යම් පුද්ගලයන් බුදුදහම තපස් චර්යා අගයන් සර්ව අශුභවාදී ස්ථාවරයක පිහිටා ඇති කලාත්මක රසවින්දනය නො අගයන දාර්ශනික මතවලින් හෙබි දහමක් ලෙස දැක්වූව ද, බුද්ධ චරිතය, නිරාමිස සුවය හා කලාකාමිත්වය ඇගයූ, විද්‍යාත්මක මත සේම දාර්ශනික මත ද ඉදිරිපත් කළ කලාව ඇගයූ, දහමක ශාස්ත්‍ර පුත්‍රයෙකු ලෙස අගය කළ හැකි ය. ■

**පූජ්‍ය උදයගිරියේ ධම්මසිරි හිමි**